**පස්සර ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

---------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 30 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 06 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **මතය**

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පස්සර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ විධිමත් සහා අනුමැතියක් නොලබා රු.2,544,600 ක් වටිනා ස්ථාවර වත්කම්, ගිණුම්වලින් ඉවත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී සභාව සතුව තිබූ කැබ් රථයක් වෙන්දේසි කර ලැබිය යුතු මුදල රු.55,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ සඳහා මුද්දර ගාස්තු වැඩියෙන් වෙන් කිරීම් වූ රු.304,106 ක් සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගැලපීම් කර නොතිබුණි.

(ඈ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සභාව වෙත ලැබුණු ජංගම කුටි 05 ක වටිනාකම රු.132,500 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.81,561 ක් වූ විශ්‍රාම වැටුප් ණයහිමි ගිණුමේ ශේෂය සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.283,465 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 25,840,009 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.19,935,250 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

රු. 77,844,306 ක ගිණුම් විෂයයන් 04 ක්, විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) 147 වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ ලියාපදිංචි ත්‍රී රෝද රථවලින් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකිරීමට කටයුතු කොට තිබුණි. |
| (ii) 154(1) වගන්තිය | සභා බල ප්‍රදේශයට අයත් කට්ටිකර විකුණන ලද ඉඩමකට අදාලව විකුණුම් වටිනාකමෙන් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරුගෙන් සභා අරමුදලට අයකරගෙන නොතිබුණි. |
| (iii) 132(ඒ) සහ (ඕ) වගන්ති | විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන අවස්ථා 05 කදී රු.70,640 ක වියදම් දරා තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 217 | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස්.46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) රීති 218 | පරීක්ෂණ මණ්ඩලයක් මගින් සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 2015 වර්ෂය සඳහා පරීක්ෂා කරවා ගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 189 | සභාවට කඩකුලී ආදායම් වශයෙන් ලැබී අගරු වූ රු.72,712 ක් වටිනා චෙක්පත් 03 ක වටිනාකම සභාව වෙත අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 | අවස්ථා 04 කදී දෙන ලද අත්තිකාරම් රු.88,496 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පියවාගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,803,722 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,609,095 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

-----------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයන්ට අදාලව ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.900,038 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල ආදායමෙන් රු.1,213,939 ක් එනම් 10 % ක් එදිනට හිඟව පැවතුණි.

2.2.2 **කඩ කාමර කුලී**

-------------------

සභාව සතු කඩ කාමර 05 ක් 2014, 2015 යන වර්ෂ දෙකේදීම ටෙන්ඩර් කර කුලී ආදායමක් උපයා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාවට කඩ කුලී ආදායමක් අහිමි කරගෙන තිබූ අතර, එම කඩ කාමරවලට අදාලව 2015 දෙසැම්බර් 31 දක්වා රු.275,000 ක හිඟ කඩ කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **ත්‍රීරෝද රථ ගාස්තු**

-------------------

සභාවේ ලියාපදිංචි ත්‍රීරෝද රථ 306 කින් 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ආදායම රු.1,075,450 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.4,556,181 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.3,603,301 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

සභා බල ප්‍රදේශයේ කට්ටිකර විකුණන ලද ඉඩමෙන් සභාවට වෙන්කරන ලද පිඹුරු අංක 3221හි ලොට් අංක 38 ඉඩම් කොටසේ අයිතිය ලිඛිතව සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 **පාරිසරික ගැටළු**

------------------

1980 අංක 47 දරන පාරිසරික පනතට අනුව කසල ප්‍රතිචක්‍රීයරණය සඳහා සභාවේ අරමුණුවලට අනුව කටයුතු කළ යුතු වුවත්, නිරාවරණ ප්‍රදේශයක කසල ගොඩගැසීම හේතුවෙන් අවට ප්‍රදේශයේ පාරිසරික බලපෑම් ඇතිවීම බැහැර කළ නොහැකිය.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

---------------------------------------

4.1 **අයවැය පාලනය**

-----------------

සමාලෝචිත වර්ෂයේ දී අයවැය ලේඛනය, ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ණයහිමි පාලනය
(ඉ) ගබඩා පාලනය